" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/06(A) | |
| ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | |
| දිනය / திகதி / Date | 2020.11.18 | |

# මූල්‍ය චක්‍රලේඛ 06/2020

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.).

## දේශීය කර්මාන්ත දිරි ගැන්වීමේ ප්‍රතිපත්තිය සහ තරඟකාරී ලංසු ක්‍රමවේදය යටතේ ලංසු ඉදිරිපත් කරන රාජ්‍ය ව්‍යාපාර සඳහා විශේෂ ප්‍රමුඛත්වයක් ලබා දීම.

භාණ්ඩාගාර ලේකම් විසින් "දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ ප්‍රතිපත්තිය" සම්බන්ධයෙන් 2020.10.09 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 03/2020 සහ "තරඟකාරී ලංසු ක්‍රමවේදය යටතේ ලංසු ඉදිරිපත් කරන රාජ්‍ය ව්‍යාපාර සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබා දීම" යන මැයෙන් 2020.11.09 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2020 හි පිටපත් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2 හා 2020.11.16 දිනැති ලිපිය මඟින් ඉහත සඳහන් චක්‍රලේඛයන් බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01.
இலங்கை
The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/MPD/Domestic/Cir.03/2020
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2020.10.09

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක **03/2020**

සියලු අමාත්‍යාංශ ලේකම්වරු,
සියලු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරු,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු,
රජය සතු සමාගම්වල සභාපතිවරු,

**දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ ප්‍රතිපත්තිය**

පහත සඳහන් කර්මාන්ත සඳහා ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේ අරමුණින් "දේශීය කර්මාන්ත සඳහා සහයෝගය දීම පිණිස ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංශෝධනය කිරීම" යන මැයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා, 2020.07.15 දිනැති අංක 20/1086/204/108 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

අ.) මෘදුකාංග හා දෘඩාංග කර්මාන්තය

ආ.) ඉදිකිරීම් කර්මාන්තය

ඇ.) ගෘහ භාණ්ඩ හා ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය

**2. මෘදුකාංග හා දෘඩාංග කර්මාන්තය**

2.1. **මෘදුකාංග නිෂ්පාදන** - මෘදුකාංග නිෂ්පාදන (සංවර්ධනය කරන ලද, ගැණුම්කරුගේ අවශ්‍යතාවය මත නිර්මාණය කරන ලද, අගය එකතු කරන ලද හෝ සේවාවක් ලෙස මෘදුකාංග යොදා ගැනීම) මිලදී ගැනීමේදී පහත සඳහන් ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු ය.

2.1.1. ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන දෙකට අඩු යෙදවුම් මෘදුකාංග සඳහා මිල ගණන් කැඳවීමේදී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) ලියාපදිංචිව සිටින හා https://startupsl.lk දරන වෙබ් අඩවියේ නම ප්‍රකාශයට පත්කොට ඇති ආරම්භක ව්‍යාපාරවලින් (startups) පමණක් එකී මිලගණන් කැඳවීම සිදු කළ යුතු ය. මෙම කොටසෙහි දැක්වෙන කාර්යය සඳහා, ආරම්භක ව්‍යාපාර යනුවෙන් අදහස් කරන්නේ අදාළ අධිකාරියක් යටතේ ව්‍යාපාරයක්

වශයෙන් මාස 06 කට වැඩි හා අවුරුදු 05 කට අඩු කාලයක් සඳහා ලියාපදිංචිව සිටින හා https://startupsl.lk වෙබ් අඩවියේ ලියාපදිංචිව සිටින ව්‍යාපාර වේ.

2.1.2. ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 02ට වැඩි මෘදුකාංග හෝ තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) විසඳුම් සඳහා මිල ගණන් කැඳවීමේදී, මෘදුකාංග විසඳුම් සඳහා අවම වශයෙන් සියයට 25 ක හෝ දේශීය අගය එකතු කිරීමක් සිදුකරන, දේශීය බහුතර හිමිකාරිත්වයක් සහිත ආයතන[1] සඳහා වරණයක් පිරිනැමිය යුතු ය. දේශීය අගය එකතු කිරීම නිශ්චය කිරීම සඳහා ලංසුකරු විසින් සිය මූල්‍ය යෝජනාව සමග දේශීය අගය එකතු කිරීම් පිළිබඳ සවිස්තරාත්මක පිරිවැය වර්ගීකරණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, ලංසු ඇගයීමේ අවස්ථාවේදී ලංසුකරු විසින් එකී අගය එකතු කිරීම් USD හා LKR වලින් වෙන්වෙන් වශයෙන් දක්වන ලද දේශීය හා විදේශීය සංරචකයන්ගේ පිරිවැය වර්ගීකරණයන් සහතික කරමින් බලයලත් විගණකවරයෙකු විසින් දෙනු ලබන සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එම අගය එකතු කිරීම සඳහා Cloud විසඳුම් හා පහත සඳහන් කුමන හෝ අයිතමයන්ගේ දායකත්වයක්, ඇතුළත් විය හැක.

අ.) දේශීය අමුද්‍රව්‍ය
ආ.) විශේෂඥ දැනුම (සියයට 25ක දේශිය අගය එකතු කිරීමෙන් අවම වශයෙන් සියයට 10ක විශේෂඥ දැනුම)
ඇ.) දේශීය පොදු කාර්ය සහයෝගිතාවය/නඩත්තු/ පද්ධති ඒකාබද්ධ කිරීම

2.1.3. දේශිය අගය එකතු කිරීම් අවම වශයෙන් සියයට 25 ක් තිබීමේ අවශ්‍යතාවය සපුරා ඇති ලංසු කරුවන්ට ඔවුන් ඉදිරිපත් කර ඇති ලංසු මිල සඳහා අනෙකුත් ලංසුකරුවන්ට සාපේක්ෂව සියයට 30 ක වරණයක් ලබා දිය යුතු අතර මෙය තාක්ෂණ ඇගයීමේදී නොව, මූල්‍ය ඇගයීමේදී පමණක් පිරිනැමිය යුතු ය.

2.2. **දෘඩාංග නිෂ්පාදන** - දෘඩාංග නිෂ්පාදන මිලදී ගන්නා විට පහත ක්‍රමවේදය අනුගමනය කළ යුතු ය.

2.2.1 පහත සඳහන් වර්ගීකරණයන් සඳහා අගය එකතුකිරීම් සිදු කර ඇති බව හඳුනාගනු ලබන අවස්ථා වලදී, දෘඩාංග නිෂ්පාදනය හා එකලස් කිරීම යන අංශ සඳහා දේශීය අගය එකතු කිරීම අවම වශයෙන් සියයට 25 ක්වත් සිදුකරන දේශිය ආයතන[1] සඳහා වරණයක් ලබා දිය යුතු ය.

අ.) අමු ද්‍රව්‍ය - (සියයට 25ක දේශිය අගය එකතු කිරීමෙන් අවම වශයෙන් සියයට 5ක දේශීය අමු ද්‍රව්‍ය යොදාගෙන තිබීම)
ආ.) විශේෂඥ දැනුම/ශ්‍රමය
ඇ.) දේශීය පොදු කාර්ය සහයෝගිතාවය/මෘදුකාංග නඩත්තුව

2.2.2 දේශීය අගය එකතු කිරීම නිශ්චය කිරීම සඳහා, ලංසුකරුවන් විසින් දේශීය අගය එකතු කිරීමේ විස්තරාත්මක පිරිවැය වර්ගීකරණයක් මූල්‍ය යෝජනාව සමග ඉදිරිපත් කල යුතු අතර එකී අගය එකතු කිරීම් සහතික කරමින් බලයලත්

[1] "දේශීය බහුතර හිමිකාරිත්වයක් සහිත ආයතන, ස්වදේශීය ආයතන හෝ දේශීය සමාගමක්" යනු ශ්‍රී ලාංකිකයින් විසින් සියයට 51 කට වැඩි හිමිකාරිත්වයක් දරනු ලබන සහ ශ්‍රී ලංකාවේ අදාළ අධිකාරියක් යටතේ එහි මුල් ලියාපදිංචිය සිදුකර ඇති ආයතනයක් වන අතර මෙම ලේඛණය සඳහා සමස්ථයක් වශයෙන් මෙම අර්ථ දැක්වීම අදාළ වේ.

විගණකවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් ලංසු ඇගයීමේ අවස්ථාවේදී ඉදිරිපත් කල යුතු ය. දේශීය අගය එකතු කිරීම් අවම වශයෙන් සියයට 25ක් සපුරා ඇතැයි සැහීමකට පත්විය හැකි ලංසුකරුවන් සඳහා සියයට 30 වරණයක් තාක්ෂණ ඇගයීමේදී නොව, මූල්‍ය ඇගයීමේදී පිරිනැමිය යුතු ය.

2.3 **සංයුක්ත විසඳුම්** (දෘඩාංග, මෘදුකාංග, පද්ධති ඒකාබද්ධ කිරීම සහ/හෝ නඩත්තු සමඟ)

2.3.1 සමස්ත සංයුක්ත විසඳුමේ මුළු දේශීය අගය එකතු කිරීම සියයට25ට වඩා ඉහළ අගයක් ගන්නේ නම්, ඉහත 2.1 හා 2.2 වගන්ති එම සංයුක්ත විසඳුම සඳහා ද අදාළ කර ගත හැකි ය.

2.3.2 දේශීය අගය එකතු කිරීම් නිශ්චය කිරීම සඳහා, ලංසුකරුවන් විසින් දේශීය අගය එකතු කිරීමේ සවිස්තරාත්මක පිරිවැය වර්ගීකරණයක් මූල්‍ය යෝජනාව සමඟ ඉදිරිපත් කළ යුතු අතර එකී අගය එකතු කිරීම් සහතික කරමින් බලයලත් විගණකවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් ලංසු ඇගයීමේ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.

2.4 ලැප්ටොප් හා ඩෙක්ස්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමේදී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් නිර්මාණය කර ඇති ස්ථාවර තාක්ෂණ පිරිවිතරයන් භාවිතා කළ යුතු ය. එකී ලැප්ටොප් හා ඩෙක්ස්ටොප් පරිගණක සඳහා සකසන ලද පිරිවිතරයන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වෙබ් අඩවියේ දක්වා ඇත. භාවිතා කරන්නන්ගේ ප්‍රශස්ත අවශ්‍යතාවයන්ට අදාළ වන පරිගණක යන්ත්‍ර තෝරා ගැනීමට රාජ්‍ය ආයතන වලට හැකි ය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් වරින් වර අදාල පිරිවිතරයන් යාවත්කාලීන කරනු ඇත.

2.5 ඉහත සඳහන් පරිපාටිය අනුගමනය කිරීමේදී තොරතුරු තාක්ෂණ කර්මාන්තය සම්බන්ධ තාක්ෂණික ගැටළුවක් හෝ අවිනිශ්චිතතාවයක් පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් අදාල ප්‍රසම්පාදන අස්ථිත්වය විසින්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් ඒ පිළිබඳ උපදෙස් ලබාගත යුතු අතර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ තීරණය අවසාන තීරණය වේ.

**3. ඉදිකිරීම් කර්මාන්තය, ගෘහ භාණ්ඩ හා ඒ ආශ්‍රිත උපකරණ** - ඉදිකිරීම් සේවා සහ ගෘහ භාණ්ඩ සැපයීම සඳහා මිල ගණන් කැඳවීමේදී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතු ය.

3.1.**ඉදිකිරීම් කර්මාන්තය;**

i. 2019.05.08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2016 (ii) හි 3.3 වගන්තියේ කොන්දේසි පිළිපදිමින්, ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 25ක් හෝ ඊට අඩු ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි C5, C6, C7, C8 හා C9 යන කාණ්ඩ වල ශ්‍රේණිගත කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් ලංසු කැඳවිය යුතු ය.

ii. ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 25ට වැඩි හා රුපියල් මිලියන 50ට අඩු හෝ සමාන කොන්ත්‍රාත් සඳහා මිල කැඳවීම් වලදී CIDA C5 හා C4 ලියාපදිංචි කාණ්ඩ වල ශ්‍රේණිගත කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ලංසු ඉදිරිපත් කිරීමට අවසර ලබා දෙනු ඇත.

iii. අ) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 50ට වැඩි හා රුපියල් මිලියන 150ට අඩු හෝ සමාන කොන්ත්‍රාත් සඳහා මිල කැඳවීම් වලදී CIDA C4 හා C3 ලියාපදිංචි කාණ්ඩ වල ශ්‍රේණිගත කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ලංසු ඉදිරිපත් කිරීමට අවසර ලබා දෙනු ඇත.

ආ) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 150ට වැඩි හා රුපියල් මිලියන 600 දක්වා වන කොන්ත්‍රාත් සඳහා මිල කැඳවීම් වලදී, CIDA මගින් පිළිගත් අනුරූපී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් සීමාවන් මත පදනම්ව, CIDA C3 හා C2 ශ්‍රේණිවල ලියාපදිංචි දේශීය සමාගම්[1] (උපදේශකවරුන් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්) වලින් පමණක් මිල ගණන් කැඳවනු ඇත.

ඇ) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 600ට වැඩි කොන්ත්‍රාත් සඳහා මිල ගණන් කැඳවීමේදී, CIDA මගින් පිළිගත් අනුරූපී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් සීමාවන් මත පදනම්ව, CIDA C1 හා ඊට ඉහල ශ්‍රේණිවල ලියාපදිංචි දේශීය සමාගම්[1] (උපදේශකවරුන් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්) වලින් පමණක් මිල ගණන් කැඳවිය යුතු ය.

iv. මෙම කර්මාන්ත සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යභාරය සැලකීමේදී, එකී රාජ්‍ය ව්‍යවසායන් විසින් තරඟකාරී මිල කැඳවීම් සඳහා මිල ගණනක් ඉදිරිපත් කර ඇති විට, එම රාජ්‍ය ව්‍යවසායන් සඳහා අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ට වඩා සියයට15ක විශේෂ වරණයක් ලබා දෙනු ඇත. මෙම වරණය තාක්ෂණික ඇගයීමේදී නොව මූල්‍ය ඇගයීමේදී පමණක් ලබා දෙනු ඇත.

v. අසාමාන්‍ය ලෙස මිල උච්චාවචනයන් සහිත ලංසු ඉදිරිපත් වීම වැලැක්වීම තහවුරු කිරීම සඳහා පහත නිර්ණායක වලට අනුගත විය යුතු ය.

අ) ලංසු මිල, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට15ට අඩු හෝ වැඩිවන අවස්ථාවකදී එම ලංසුව ප්‍රතික්ෂේප කල යුතු ය.

ආ) ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සැලකිය යුතු පිරිවැය විචලනයක් සහිත බැහැරවීම් කිහිපයක් ඇති අවස්ථාවක අදාල ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉහත ක්‍රියාමාර්ගයන්ට එළඹීමට පෙර එකී ඉංජිනේරු ඇස්තමේන්තුව නැවත සලකා බැලීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.

vi. ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වලට සහයෝගය දැක්වීමේ අරමුණින් ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් සිය වැඩ වලින් අවම වශයෙන් සියයට 25 ක (සිවිල්, යාන්ත්‍රික, විද්‍යුත්, ජලනල ආදී), ප්‍රමාණයක් උප කොන්ත්‍රාත් ලෙස අදාල කාණ්ඩ යටතේ CIDA හි ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කල යුතු ය.

vii. ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් තාවකාලික වෙන් කිරීම් (provisional sum) හැර කොන්ත්‍රාත් වටිනාකමින් සියයට10 ට වඩා වැඩි අගයක් විදේශීය කොන්ත්‍රාත්කරුවන් වෙත උප කොන්ත්‍රාත් වශයෙන් ලබා නොදිය යුතු ය.

viii. දේශීය වශයෙන් වන සියලු ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ප්‍රමාණ පත්‍රය යටතේ ඇමුණුම් (i) හි සඳහන් භාණ්ඩ සහ අමුද්‍රව්‍ය අවශ්‍ය වන විට එකී භාණ්ඩ සහ අමුද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම දේශීය වශයෙන් පමණක් සපයා ගත්/නිෂ්පාදිත භාණ්ඩ/ අමුද්‍රව්‍ය විය යුතු ය.

3.2. වැඩ කොන්ත්‍රාත්තුවේ කොටසක් වශයෙන් හෝ වෙනම භාණ්ඩ කොන්ත්‍රාත්තුවක් වශයෙන් ගෘහ භාණ්ඩ හා ආශ්‍රිත නිෂ්පාදන ප්‍රසම්පාදනය කරන විට, එකී සියලු ගෘහ භාණ්ඩ දැවමත පදනම් වූ ගෘහ භාණ්ඩ හා දැවමත පදනම් නොවූ ගෘහ භාණ්ඩ සඳහා පිළිවෙලින් අවම වශයෙන් සියයට70 හා සියයට 50ක අගය එකතු කිරීමක් සහිත දේශීය ප්‍රභවයන්ගෙන් පමණක් ලබා ගත යුතු ය. ආනයනික දැව භාවිතය දිරි ගැන්වීම සඳහා, දේශීය අගය එකතු කිරීම ගණනය කිරීමේදී ආනයනික දැව සඳහා වූ මිල ගණන් එකතු කරනු ඇත.

**4.** දේශීය ප්‍රමුඛතාවය පිරිනැමීම සඳහා ඉහත සඳහන් නිර්ණායක මෘදුකාංග හා දෘඩාංග කර්මාන්තය, ඉදිකිරීම් කර්මාන්තය හා ගෘහ භාණ්ඩ හා ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය යන කර්මාන්ත සඳහා පමණක් අදාළ වේ. ඉහත ක්ෂේත්‍ර හැර අනෙකුත් සියලු භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 (භාණ්ඩ හා වැඩ) හි 7.9.4, 7.9.5 හා 7.9.6 වගන්ති හා ඊට අදාලව ප්‍රසම්පාදන අත්පොත (භාණ්ඩ සහ වැඩ) සඳහා නිකුත් කර ඇති අතිරේක රෙගුලාසි තවදුරටත් එලෙසම අඛණ්ඩව බලාත්මක වනු ඇත. තවද, 2016.03.16 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2016 සහ එම චක්‍රලේඛයට සිදු කරන ලද සංශෝධනයන් තවදුරටත් එලෙසම අදාළ වේ. මෙම චක්‍රලේඛය ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ එකඟතාවය මත නිකුත් කරනු ලැබේ.

**5.** මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් අදාළ ගැටලු සහ පැහැදිලි කර ගැනීම් සඳහා පහත ආයතන ඇමතිය හැකිය.

| චක්‍රලේඛ වගන්තිය | ආයතනය | දුරකථන අංකය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|---|
| 01 - 04 | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් | 0112484614 | dgpf@pfd.treasury.gov.lk |
| 02 | අංශ ප්‍රධානි (ප්‍රතිපත්ති), ICTA | 0112369099 | gov-request@icta.lk<br>or<br>gov-procurement@icta.lk |
| 03 | අධ්‍යක්ෂ ජනරාල්, CIDA | 0112696017 | info@cida.gov.lk<br>or<br>dirdev@cida.gov.lk |

එස්. ආර්. ආටිගල
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍යමණ්ඩල ලේකම්
4. විගණකාධිපති

ඇමුණුම 01

**දේශීයව උකහා ගන්නා ලද / නිෂ්පාදිත ගොඩනැගිලි ද්‍රව්‍ය ලැයිස්තුව**

1. සිමෙන්ති.(Cement)
2. වානේ ශක්තිමත් කිරීම සහ නමන ලද වානේ කොටස්.(Reinforcing Steel and Certain sections of Steel angles)
3. මැටි ගඩොල්, සිමෙන්ති කුට්ටි සහ කොන්ක්‍රීට් නිෂ්පාදන. (Clay Bricks, Cement Blocks and Concrete Products)
4. සෙවිලි ද්‍රව්‍ය (මැටි උළු, සිමෙන්ති උළු, ඇස්බැස්ටෝස්, සින්ක් ඇලුමිනියම්, ජීඅයි (Clay tiles, Cement tiles, Asbestos, Zink alum, GI)
5. පිඟන් මැටි සහ කළුගල් උළු. (Ceramic and granite tiles)
6. පාකට් සහ දැවමය බිම් සකස් කිරීම්. (Parquet & wooden flooring)
7. පැන්ට්රි කබඩ් සහ දැවමය ගෘහ භාණ්ඩ. (Pantry Cupboards and Wooden furniture)
8. පිවීසී (PVC) සහ යූපිවීසී (UPVC) පයිප්ප, ආවරණ (Gutters), බිම් පයිප්ප (Down Pipes) සහ සවිකිරීම් (Fittings)
9. LT විදුලි රැහැන්. (Electric Cables LT)
10. උපාංග සහිත ට්‍රාන්ස්ෆෝමර් (Transformers with accessories)
11. විදුලි ස්විච සහ සොකට්, සිවිලිම් විදුලි පංකා. (Electrical switches & sockets, Ceiling fans)
12. ඇලුමිනියම් නිස්සාරණ (Aluminum extrusions), දොරවල් සහ ජනෙල්.(Doors and windows)
13. ස්ලයිඩින් / රෝලර් ෂටර් දොරවල් සහ ගේට්ටු. (Sliding / Roller Shutter doors and gates)
14. ගිනි ශ්‍රේණිගත කිරීම් සහිතව ප්ලයිවුඩ් දොරවල්, දැවමය දොරවල්, ෆයිබර් වීදුරු දොරවල් සහ වානේ දොරවල් . (Plywwod doors, wooden Doors, Fiber glass doors & steel doors including fire rated)
15. පිත්තල යකඩ මොන්ගරි (Brass iron mongery)
16. තීන්ත.(Paints)
17. ජල පොම්ප, ෆුට් වැල්. (Water Pumps, Foot valves)
18. විදුලි පැනල් පුවරු. (Electrical Panel Boards)

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | PFD/PMD/Domestic/Cir.04/2020 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2020.11. 09 |

**රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2020**

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන්

<u>තරඟකාරී ලංසු ක්‍රමවේදය යටතේ ලංසු ඉදිරිපත් කරන රාජ්‍ය ව්‍යාපාර සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදීම</u>

රාජ්‍ය ව්‍යාපාර (Public Enterprises) ශක්තිමත් කිරීමේ අරමුණෙන් රජයේ වර්තමාන ප්‍රතිපත්ති රාමුවට අනුගතව, රාජ්‍ය ආයතන විසින් තරඟකාරී ලංසු ක්‍රමවේදය මත දේශීය අරමුදල් උපයෝගී කරගෙන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීමේදී, රාජ්‍ය ව්‍යාපාර විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබා දීමට 2020.10.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

02. ඒ අනුව, රාජ්‍ය ආයතනයක තරඟකාරී ප්‍රසම්පාදනයකදී රාජ්‍ය ව්‍යාපාර විසින් ලංසුවක් ඉදිරිපත් කරන විට, එම ලංසුව සඳහා සෙසු ලංසුකරුවන්ට වඩා 15% ක විශේෂ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු ය. රාජ්‍ය ආයතනයක් ලංසු ඇගයීම් අවස්ථාවේදී, මෙම විශේෂ ප්‍රමුඛතාවය සලකා බැලිය යුතු වන්නේ මූල්‍ය ඇගයීම් අවස්ථාවේ දී පමණක් වන අතර, තාක්ෂණික ඇගයීමේදී එවැනි ප්‍රමුඛතාවයක් සලකා බලනු නොලැබේ. මෙම ප්‍රමුඛතාවය හිමිවනුයේ රාජ්‍ය ව්‍යාපාර විසින් ඉදිරිපත්කරන ලංසුවේ සඳහන් භාණ්ඩ හා සේවා සඳහා දේශීය අමුද්‍රව්‍ය, ශ්‍රමය, පොදු කාර්ය පිරිවැය ආදී යෙදවුම් තුලින් වැඩි දේශීය අගය එකතුකිරීමක් ඇති බවට අදාළ ප්‍රසම්පාදන කමිටුව විසින් සෑහීමකට පත්වන්නේ නම් පමණි.

03. 2020.10.09 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 හි 01 ඡේදයේ සඳහන් කර ඇති මැදුකාංග හා දෘඩාංග කර්මාන්තය, ඉදිකිරීම් කර්මාන්තය, ඖෂධ භාණ්ඩ හා ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය යන ක්ෂේත්‍රයන්හි නියැලී සිටින රාජ්‍ය ව්‍යාපාරයන්ට එම චක්‍රලේඛයේ සඳහන් විශේෂ ප්‍රමුඛතාවයන් දැනටමත් හිමිවන බැවින් මෙම චක්‍රලේඛයේ 02 ඡේදයේ සඳහන් විශේෂ ප්‍රමුඛතාවය ලබා ගැනීමට හිමිකමක් නැත.

04. මෙම චක්‍රලේඛය පිළිබඳ තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2484614 මඟින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් ඇමතිය හැකි ය.

එස්.ආර් ආටිගල
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති